# සාමාන්‍යාධිකාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

සී/ස ගාල්ල දිස්ත්‍රික් සණස සමිති සංගමයේ පුරප්පාඩුව පවතින සාමාන්‍යාධිකාරී තනතුර සඳහා 02/2022 දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ චක්‍රලේඛය අනුව අයදුම්පත් කැඳවනු ලැබේ.

**කේත අංකය : EL 01 ශ්‍රේණිය III ශ්‍රේණිය**

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2024.03.31**

**වයස් සීමාව : අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතුය.**

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ්‍යය, කළමනාකරණය, ගණකාධිකරණ, ආර්ථික විද්‍යා යන ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 05 කට නොඅඩු පළපුරුද්ද / පුහුණුව ලබා තිබීම

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඕනෑම උපාධියක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ වසර 01 කට නොඅඩු ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක විධායක තනතුරක වසර 05 කට නොඅඩු පළපුරුද්ද/පුහුණුව ලබා තිබීම .

**හෝ**

EL–02 මට්ටමේ I ශ්‍රේණියේ තනතුරක සේවය කිරීම හෝ EL–02 මට්ටමේ III ශ්‍රේණියේ තනතුරක වසර 04 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :** EL-01-24,500–700x5-800x5-900x 10-1,000x10-1,100x12–64,200

මෙයට අමතරව සමුපකාර සේවක කොමිෂන් සභාව 01/2022 චක්‍රලේඛනය අනුව අනුමත ජීවන අංක දීමනාව රු. 2,500.00 සහ රු. 5,000.00 දීමනාව සහ සංගමයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇති වෙනත් දීමනා ගෙවනු ලැබේ.

වෙනත් සමුපකාර සමිතියක සේවය කරන අයකු අයදුම්පත් අදාළ සමිතිය මගින් ඉදිරිපත් කළ යුතුය. සමුපකාර සමිතියක සේවය කරන අතරතුර සෘජුව අයදුම්පත් එවා ඇති බව ඔහු/ඇය තෝරාගත් පසුව වුවද අනාවරණය වුවහොත් තනතුර අහිමි වීමට එය හේතුවක් වන බව දන්වමි.

**අයදුම්පත් එවිය යුතු ක්‍රමය :** තමා විසින් පිළියෙල කරගත් අයදුම්පතක් සමග සුදුසුකම් සනාථ කිරීමේ සහතිකවල ඡායා පිටපත් උප්පැන්න සහතිකයේ සහ හැඳුනුම්පතේ ඡායා පිටපත් අනිවාර්ය වේ.

**අයදුම්පත් එවිය යුතු ලිපිනය :**

**ගරු සභාපති, සී/ස ගාල්ල දිස්ත්‍රික් සණස සමිති සංගමය, තක්සලා, 153, අබ්දුල් වහබ් මාවත, ගාල්ල**

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ පැමිණ භාර දිය හැක.

ලියුම් කවරයේ වම්පස ඉහළ **"සාමාන්‍යාධිකාරී තනතුර සඳහා"** යනුවෙන් සඳහන් විය යුතුය.